සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## தென் மாகாணக் கல்வித் திணைக்களம்
## Southern Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) 12 ශ්‍රේණිය, තුන්වන වාර පරීක්ෂණය, 2019 ජූලි

**General Certificate of Education (Adv. Level), Grade 12, Third Term Test, July 2019**

**බෞද්ධ ශිෂ්ටාචාරය - I**
**Buddhist Civilization - I**

45 | S | I

පැය 02 යි
**Two hours**

විභාග අංකය:..................................................................

උපදෙස්
- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- 1 - සිට 50 දක්වා වූ ප්‍රශ්න වලට ඉතාමත් නිවැරදි පිළිතුරු තෝරා ගෙන උත්තර පත්‍රයේ නිවැරදි වරණය මත කතිර ලකුණු යොදන්න.

1. බ්‍රාහ්මණ ඉගැන්වීම්වල දැක්වෙන ස්ව ධර්මයන් ඒ අයුරින් ම ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ අවස්ථාවන් උදා වූ විට බ්‍රාහ්මණ ඉගැන්වීම් වල ඒ සඳහා විකල්ප ඉගැන්වීමක් ද ඉදිරිපත් කර තිබුණි. එසේ ඉදිරිපත් වූ විකල්ප ඉගැන්වීම වූයේ,
   1. උපනයනයයි
   2. ආශ්‍රම ධර්මයි
   3. වර්ණ ධර්මයි
   4. ආපද් ධර්මයයි
   5. නියාම ධර්මයයි.

2. තම ආධිපත්‍යය සමාජය තුළ පවත්වාගෙන යෑම සඳහා බ්‍රාහ්මණයින් ආගම මුල්කරගත් බොහෝ ඉගැන්වීම් ඉදිරිපත් කර ඇත. ඒ අතර ස්ව ධර්මය එක් ඉගැන්වීමකි. චතුර වර්ණයන්ට අදාල ක්‍රියාකාරකම් මේ තුළින් ඉදිරිපත් කෙරුණි. ඒවායින් ඇතැම් ක්‍රියාකාරකම් කුලීන වර්ණ තුනට ම අයත් විය. ඇතැම් ඒවා එම වර්ණයන්ට අනන්‍ය විය ඒ අනුව බ්‍රාහ්මණ වරණයට පමණක් අනන්‍ය වූ ස්ව ධර්ම ඇතුළත් වන්නේ,
   1. යාග කරවීම, ඉගැන්වීම, කාමයෙහි නොඇලීම
   2. යාග කරවීම, ඉගැන්වීම, දන්පිළිගැනීම
   3. ගාය කරවීම, ඉගෙන ගැනීම, දන්දීම
   4. යාග කිරීම, ඉගැන්වීම, ඉගෙන ගැනීම.
   5. යාග කිරීම, ඉගෙන ගැනීම, දන් පිළිගැනීම

3. වෛදික යුගයේ විසූවන් දෙවියන් පිළිබඳ අතිශය බිය ජනක ස්වභාවයෙන් පුද්ගල හා සමාජ යහපත උදාකරදීමේ අපේක්ෂාවෙන් විවිධ ආගමික ක්‍රියාකාරකම්වල නියැලුණ හ. ඔවුහු දෙවියන් සතුටු කරලීමේ අභිලාෂයෙන් සිදු කළ ප්‍රධානතම ආගමික මෙහෙය වූයේ.
   1. දෙවාල ඉදි කර දීම ය.
   2. වේද ග්‍රන්ථ රචනා කිරීම ය.
   3. යාග කර්ම කිරීම ය.
   4. ආශ්‍රම ධර්ම ක්‍රියාත්මක කිරීම ය.
   5. පූජක දිවියක් ගත කිරීම ය.

4. ජන්මය මත පුද්ගලයා වර්ගීකරණයට ලක් කිරීමට බ්‍රාහ්මණයින් වර්ණ සංකලක්පය උපයෝගී කරගෙන ඇත. බුදුරදුන් එම සංකල්පය විවේචනයට ලක් කරනු ලැබුවේ චතුර් වර්ණයම සමාන බවට සාක්ෂි ඉදිරිපත් කරමිනි. එම සාක්ෂි තුළින් මානව වර්ගයාගේ ඒකත්වය සනාථ කර ඇත. එසේ නමුත් මානව වර්ගයාගේ යම් විවිධත්වයක් දැකිය හැකි අවස්ථාවන් ද අවධාරණය කර ඇත. එකී විවිධත්වයට හේතු වන්නේ,
   1. සමාජ විද්‍යාත්මක පදනමයි.
   2. ඓතිහාසික පදනමයි.
   3. ජීව විද්‍යාත්මක පදනමයි.
   4. නීතිමය පදනමයි.
   5. ආචාර විද්‍යාත්මක පදනමයි.

5. ''විටෙක ආර්යයා දාසයයෙක් ද, තවත් වරෙක දාසයා ආර්යයෙක් ද විය හැකි ය. පාලකයා පරදවා වෙනත් අයෙකු රජ වූ විට පාලකයා පාලිතයා බවට පත් වේ.'' යනාදී වශයෙන් අස්සලායන සූත්‍රයේ සඳහන් මෙම දේශනාව තුළින් බුදුරජාණන් වහන්සේ ප්‍රකට කිරීමට උත්සහ කළේ,
   1. වර්ණ භේදයෙහි පවත්නා නිස්සාරත්වයයි.
   2. වේදයේ පවත්නා නිස්සාරත්වයයි.
   3. ආශ්‍රම ධර්මවල පවත්නා නිස්සාරත්වයයි.
   4. ජීවිතයෙහි පවත්නා නිස්සාරත්වයයි.
   5. ආපද් ධර්මවල පවත්නා නිස්සාරත්වයයි.

6. වෛදික බ්‍රාහ්මණයන්ගේ මූලික නීති සංග්‍රහය වන මනුස්මෘතියට අනුව කිසිදු අවස්ථාවක ස්වාධීන ව ක්‍රියා කිරීමේ අයිතිය කාන්තාවට නොදිය යුතු ය. ඇය සිය ජීවිතයේ විවිධ අවදි ගත කළ යුත්තේ පුරුෂයාගේ රැකවරණය යටතේ ය. ඒ අනුව අවිවාහත තරුණිය සිය ජීවිතය ගත කළ යුත්තේ,
   1. බාල සහෝදරයාගේ රැකවරණය යටතේ ය.
   2. පියාගේ රැකවරණය යටතේ ය.
   3. වැඩිමහල් සහෝදරයාගේ ආධිපත්‍යය තුළ ය.
   4. ගුරුවරයාගේ රැකවරණය යටතේ ය.
   5. පවුලේ පිරිමි සාමාජිකයන්ගේ රැකවරණය යටතේ ය.

7. බුද්ධිමත් වූ ද සිල්වත් වූ ද ඇතැම් ස්ත්‍රීහු නැදිමයිලන් දෙවියන් සේ පුදන්නියෝ පතිව්‍රතාවෙන් යුක්ත වෙති. ඒ නිසා ස්ත්‍රිය පෝෂණය කළ යුතු ය. එබඳු ස්ත්‍රීන් නිසා උපදින දරුවෝ සූරයෝ වෙති. මේ ප්‍රකාශය කවුරුන් විසින් කා හට කියන ලද්දක් ද?
   1. බුදුරදුන් විසින් කොසොල් රජු අරඹයා ය.
   2. ආනන්ද තෙරුන් විසින් කොසොල් රජු අරඹයා ය.
   3. දේවතාවියක් විසින් කුණ්ඩලකේසිය අරඹයා ය.
   4. සෝමා තෙරණිය විසින් මාරයා අරඹයා ය.
   5. බුදුරදුන් විසින් ආනන්ද තෙරුන් අරඹයා ය.

8. බුදුරදුන් පහල වන විට ශ්‍රමණ චින්තනය තුළ විශාල අනුගාමිකයින් පිරිසකට නායකත්වය ලබා දෙමින් කටයුතු කළ ආගමිකයන් අතර ෂට් ශාස්තෘවරු ප්‍රමුඛ වෙති. මොවුන් විසින් විවිධ දර්ශන ඉදිරිපත් කරන ලදී. නමුත් ඔවුන් සියලු දෙනාම බැහැර කළ ආගමික මතයක් වන්නේ,
   1. සියලු ම මිනිස්සු මරණයෙන් උච්ඡේදයට පත්වන බවයි.
   2. සියලු දෙනා නියතියකට අනුව සසර ගමන් කරන බවයි.
   3. කිසිවකු කරන හොඳ හෝ නරක ක්‍රියාවකට විපාකයක් නැති බවයි.
   4. සියලු දෙනා සදාතනික පරමාණු පදාර්ථවලින් නිර්මාණය වී ඇති බවයි.
   5. සමාජයේ යහ පැවැත්මට කුල භේදය අත්‍යවශ්‍ය බවයි.

9. ෂට් ශාස්තෘවරු අතර පරම අවිහිංසාවාදය හා නියතිවාදය ප්‍රචලිත කළ ශාස්තෘවරුන් වන්නේ,
   1. පකුධ කච්චායන හා නිගණ්ඨනාථ පුත්ත ය.
   2. නිගණ්ඨනාථපුත්ත හා මක්ඛලී ගෝසාල ය.
   3. පූර්ණ කස්සප හා පකුධ කච්චායන ය.
   4. නිගණ්ඨනාථපුත්ත හා අජිත කේසකම්බල ය.
   5. නියණ්ඨනාතපුත්ත හා පූර්ණ කස්සප ය.

10. බුදුරදුන් පහලවන වකවානුවේදී භාරතීය ආගමික පරිසරය විවිධ ආගමික මතවාදවලින් ගහන වූවක් විය. මිනිස්සු මේ ආගමික ඉගැන්වීම් වලට ලක්ව අවුලෙන් අවුලට පත්ව සිටිය හ. අහේතු අප්පච්චයවාදය එසේ පැවැති දර්ශන වාදයන්ගෙන් එකකි. එම දර්ශන වාදය ඉදිරිපත් කළ අය අතර ප්‍රමුඛයන් වන්නේ,
   1. ආජීවකයන් ය.
   2. ජෛනයන් ය.
   3. පරිබ්‍රාජකයින් ය.
   4. තාපසයින් ය.
   5. ජටිලයන් ය.

11. සමරසේන රජයේ රැකියාවක් කළ ද අමුතුම ගති පැවතුම් වලින් යුක්ත අයෙකි. ඔහු කිසි විටකත් පින් පව් මෙන් ම හොඳ නරක ද ඒවාට අනුරූපීව පවත්නා විපාක ද පිළිනොගනී. සමරසේනගේ අදහස්වලට සමානකම් දක්වන දහමක් බුද්ධ කාලයේ ඉදිරිපත් කරනු ලැබුවේ,
   1. සංජය බෙල්ලට්ඨිපුත්ත ශාස්තෘවරයා ය.
   2. නිගණ්ඨනාථපුත්ත ශාස්තෘවරයා ය.
   3. ආලාර කාලාම ශාස්තෘවරයා ය.
   4. පූර්ණ කාශ්‍යප ශාස්තෘවරයා ය.
   5. සෝණදණ්ඩ බ්‍රාහ්මණයා ය.

12. නිශ්චිත පිළිතුරක් ලබාදීමට අපොහොසත් අමරා වික්ෂේපවාදී දර්ශනයක් ඉදිරිපත් කළ සංජය බෙල්ලට්ඨිපුත්ත වැනි ශාස්තෘවරුන් එබඳු ක්‍රමයක් අනුගමනය කිරීමට හේතු හතරක් ඇති බව බුද්ධ දේශනයයි. ඒ අනුව **තමා පිළිතුරක් ලබාදෙන කල්හි යමෙක් ප්‍රශ්න විචාරන්නේ නම් එසේ ප්‍රශ්න කරනු ලැබීමට ඇති බිය හා අකමැත්ත නිසා පිළිතුරු ලබාදීමක් සිදු කර නැත.** එයට අදාල හේතුව වන්නේ,
   1. මුසාවාද භයයි. 2. උපාදාන භයයි. 3. අනුයෝග භයයි. 4 අත්තානුවාද භයයි. 5. මන්දත්තා මොමූහත්තා භයයි.

13. භාරතය විශාල භූමි ප්‍රදේශයකට හිමිකම් කියූ රටක් බව ඉතිහාස කරුණු අධ්‍යයනයේදී පැහැදිලි වේ. මෙය ක්‍රි.පූ අටවන සියවස වන විට පෞර රාජ්‍යයක් ලෙස පැවතුනි. එකල බලයේ සිටි නිචක්ෂු නම් පාලකයාගේ වකවානුවේ එම පෞර රාජ්‍යයේ බිඳවැටීම සිදු විය. එසේ බිඳ වැටීමට බලපෑ ප්‍රධානත ම හේතුව වූයේ,
   1. අනාර්ය ජන කොට්ඨාසයෙන් එල්ල වූ පහර දීම් ය.
   2. සංස්කෘතික වශයෙන් ගොඩනැගෙමින් පැවැති විවිධත්වයන් ය.
   3. එකල අගනුවර වශයෙන් පැවැති හස්තිනාපුරය නිතර ජලයෙන් යටවීම ය.
   4. අගනුවර වෙනස් කිරීම නිසා ප්‍රාදේශීය පාලකයන් ස්වාධීනව කටයුතු කිරීමට පෙළඹීම ය.
   5. බ්‍රාහ්මණ ආධිපත්‍යය ක්‍රමයෙන් ගිලීයාම ය.

14. බුදුරජාණන් වහන්සේ සමඟ බොහෝ භාරතීය පාලකයන් සබඳතා පවත්වා ඇති බව සූත්‍ර හා විනය පිටකාගත තොරතුරුවලින් පැහැදිලි වේ. උපෝසථ කර්මය අනුදැනීමත්, අදත්තාදාන පාරාජිකාව පැනවීමත් සිදු කරන ලද්දේ කුමන රජතුමාගේ ඉල්ලීම මත ද?
   1. බිම්බිසාර රජතුමාගේ ඉල්ලීම මත ය.
   2. කොසොල් රජතුමාගේ ඉල්ලීම මත ය.
   3. උදේන රජතුමාගේ ඉල්ලීම මත ය.
   4. අජාසත් රජතුමාගේ ඉල්ලීම මත ය.
   5. චණ්ඩපජ්ජෝත රජතුමාගේ ඉල්ලීම මත ය.

15. බුද්ධකාලීන භාරතය තුළ සොළොස් මහා ජනපද පැවැති බව බෞද්ධ සූත්‍ර සාහිත්‍යයේ හා ජෛන සාහිත්‍ය තුළ දක්නට ලැබේ. එයින් බරණැස, තක්ෂිලා හා ඉන්ද්‍රප්‍රස්ථ යන අගනුවර පිළිවෙලින් අයත්වන වරණය වන්නේ,
   1. කාසි, කුරු හා ගන්ධාර ජනපද
   2. කාසි, වත්ස හා කෝසල ජනපද
   3. ගන්ධාර කාසි චේති ජනපද
   4. ගන්ධාර, පංචාල හා කුරු ජනපද
   5. කාසි, ගන්ධාර හා කුරු ජනපද

16. බුදුරදුන් ප්‍රමුඛ මහා සංඝරත්නය වෙනුවෙන් ආරාම ඉදිවීම සොළොස් මහා ජනපදයන්ට අයත් බොහෝ රාජ්‍යයන්හි සිදු විය. වත්ස රාජ්‍යයේ ද ආරාම ගණනාවක් ඉදිකොට තිබූ බව ශාසන ඉතිහාසයේ සඳහන් වේ. ඉන් කිහිපයක් වනුයේ,
   1. ජේතවනාරාමය, පූර්වාරාමය, ඝෝෂිතාරාමය
   2. ජේතවනාරාමය, පූර්වාරාමය, රාජකාරාමය
   3. ජේතවනාරාමය, කුක්කුටාරාමය, ඝෝෂිතාරාමය
   4. පාවාරිකාරාමය, පූර්වාරාමය, ඝෝෂිතාරාමය
   5. පාවාරිකාරාමය, කුක්කුටාරාමය, ඝෝෂිතාරාමය

17. අවන්තියේ පාලකයා වූ චණ්ඩපජ්ජෝත රජු තෙරුවන් සරණ ගිය උපාසකයෙක් බවට පත් වූයේ,
   1. පුණ්ණ මන්තානි පුත්ත තෙරන් වහන්සේගෙන් ධර්මය ඇසීමෙනි.
   2. බෙල්ලට්ඨිසීය තෙරුන් වහන්සේගෙන් ධර්මය ඇසීමෙනි.
   3. මහ මුගලන් තෙරුන් වහන්සේගෙන් ධර්මය ඇසීමෙනි.
   4. මහා කච්චායන තෙරුන් වහන්සේගෙන් ධර්මය ඇසීමෙනි.
   5. පිණ්ඩෝල භාරද්වාජ තෙරුන් වහන්සේගෙන් ධර්මය ඇසීමෙනි.

18. භාරතීය ආර්ථික ව්‍යුහය පිළිබඳ ව විමසීමේදී විවිධ ධනෝපායන ක්‍රම ගණනාවක් පැවැති බව හඳුනාගත හැකි ය. ඉන් ආර්ය ජනාවාස ආරම්භයට පෙර සිටම පැවති ප්‍රබල ජීවන වෘත්තියක් වන්නේ,
   1. ගෘහ කර්මාන්තයි
   2. රාජ්‍ය සේවයයි.
   3. කෘෂි කර්මාන්තයයි.
   4. සත්ව පාලනයයි.
   5. වාණිජ්‍යයයි

19. ක්‍රි.පූ. හයවන සියවසේ විවිධ ආර්ථික රටාවන් හා විවිධ ජීවන වෘත්තීන් පැවැති බවට තොරතුරු මූලාශ්‍ර මගින් හමු වේ. ගැල් ප්‍රවාහනයෙන් කළ වෙළඳාම් ද භාරුකච්ඡ වැනි වරායන් ඔස්සේ කළ නාවික වෙළඳාම ද ඒ ඒ වාණිජ නගර යා කරමින් පැවැති ප්‍රධාන වෙළඳ මාර්ග ද ක්‍රියාත්මක වීමෙන් ප්‍රකට වන්නේ,
   1. බුද්ධකාලීන භාරතය වාණිජ්‍යකරණයට හා නාගරීකරණයට පත් වී තිබූ බවයි.
   2. බුද්ධකාලීන භාරතයේ රැකියා අවස්ථා බහුලව වූ බවයි.
   3. දියුණු මාර්ග පද්ධතියක් පැවැති බවයි.
   4. මනා ප්‍රවාහන පද්ධතියක් පැවැති බවයි.
   5. නාවික මාර්ග වෙළඳාමට උපකාරී වූ බවයි.

20. බමුණන් විසින් දීර්ඝ කාලයක් මුළුල්ලේ පවත්වාගෙන එනු ලැබූ පන්ති සමාජය බුද්ධ කාලය වන විට ක්‍රමයෙන් වෙනසකට භාජනය වෙමින් පැවැතුණි. සමාජයේ තුන්වෙනි පන්තිය නියෝජනය කළ වෛශ්‍යයන් බ්‍රාහ්මණ වංශිකයින්ට මෙන් ම ක්ෂත්‍රිය වංශිකයින්ට ද අභියෝගාත්මක ව නැගී සිටි බවක් දක්නට ලැබේ. ඔවුන් එසේ ප්‍රබලයින් වීමට බලපෑ හේතූන් අතර ප්‍රමුඛ හේතුව වන්නේ,
   1. වෙළඳාම හා කර්මාන්ත තුළින් විශාල ධනයක් හිමිකරගෙන සිටීමයි.
   2. ප්‍රශස්ත මට්ටමේ අධ්‍යාපනයක් ලබා සිටීමයි.
   3. විශාල ගොවිබිම් පවත්වාගෙන යාමයි.
   4. වෙළඳාම තුළින් විදේශ සබඳතා ගොඩනගාගෙන සිටීමයි.
   5. ශ්‍රමණ සම්ප්‍රදායේ අනුග්‍රාහකයින් වශයෙන් කටයුතු කිරීමයි.

21. සිද්ධාර්ථ මහ බෝසතාණන් වහන්සේ සම්බුද්ධත්වයට පත්වීමේදී ලැබූ සර්වඥතා ඥාන උපදවා ගත් බව බුද්ධ චරිතයේ දක්වේ. එම ඥානයන්ට අයත් වන දිබ්බචක්ඛු ඥානය නම්,
   1. පෙර ආත්මය පිළිබඳ දැන ගැනීමේ ඥානයයි.
   2 දෙවියන්ගේ සිත්වල ඇති දේ දැකීමේ ඥානයයි.
   3. මිනිසුන්ගේ සිත්වල ඇති දේ දැකීමේ ඥානයයි.
   4. සත්වයාගේ චුතියහා උත්පත්තිය දැන ගැනීමේ ඥානයයි.
   5. ලෝකය යථාර්ථ වශයෙන් දැක ගැනීමේ ඥානයයි.

22. බුදුරජාණන් වහන්සේගේ විවිධ ඥාන අතර තමන් වහන්සේ සම්මා සම්බුද්ධ වූයෙමි යි ප්‍රතිඥා කරන විට මෙය ඔබ වහන්සේ විසින් අවබෝධ කරගෙන නැතැ යි කරුණු සහිතව ප්‍රතිචෝදනා කරන බ්‍රාහ්මණයෙකු දෙවියකු හෝ මම නොදකිමි යි යනුවෙන් දක්වෙනුයේ කුමන ඥානයක් සම්බන්ධයෙන් ද?
   1. ත්‍රිවිද්‍යාව සම්බන්ධයෙනි.
   2. චතුර්වෛශාරද්‍ය ඥානය සම්බන්ධයෙනි.
   3. පසළොස් චරණ ධර්ම සම්බන්ධයෙනි.
   4. අෂ්ට විද්‍යාව සම්බන්ධයෙනි.
   5. දසබල ඥානය සම්බන්ධයෙනි.

23. බුදුරජාණන් වහන්සේ ශාස්වත හා ආශාස්වත යන අන්තද්වයට නො පැමිණ සුන්දර වූ නිවහනට ගිය බැවින් ද එම නිවනට යයපත් ආකාරයෙන් ගිය බැවින් ද සුදුසු තැන සුදුසු වචන යහපත්ව දේශනා කරන බැවින් ද උන් වහන්සේ,
   1. ලෝක විදූ නම් වේ.
   2. අරහං නම් වේ.
   3. සත්තාදේව මනුස්සානං වේ.
   4. සම්මා සම්බුද්ධ නම් වේ.
   5. සුගත නම් වේ.

24. ''ගැහැවිය තොපගේ ගෙය බොහෝ දවසක් ඔවුනට පැන් පොකුණක් මෙන් සිටියේ ය. එ හෙයින් එළඹියා වූ ඔවුනට පිණ්ඩපාතය දිය යුතු කොට සිතව'' බුදුරදුන් උපාලි ගෘහපති අරඹයා කළ මෙම ප්‍රකාශයෙන් පිළිබිඹු වන උසස් ගුණාංගය වන්නේ,
   1. ආගමික සහජීවන ප්‍රතිපදාවයි
   2. ජනමතයට ඇහුම් කන්දීමේ ගුණයයි.
   3. මහා කරුණා ගුණයයි.
   4. චින්තන හා විමංශන නිදහසයි.
   5. සමානාත්මතා ගුණයයි.

25. මාර දූහිතෘන්, මාගන්ඩියා ආදීන් පෙළඹවීම හමුවේ විරාගිකවීම, ආලවක, අග්ගික භාරද්වාජ, ආදී කෝප වූවන් අතර කෝප නොවී සිටීම ආදියෙන් මූර්තිමත්වන බුදුරජාණන් වහන්සේගේ ජීවිතය හැඳින්වෙනුයේ,
   1. ආචාරශීලී ජීවිතයක් ලෙසයි.
   2. ආදර්ශවත් ජීවිතයත් ලෙසයි.
   3. පද්මාකාර ජීවිතයක් ලෙසයි.
   4. සමාජශීලී ජීවිතයක් ලෙසයි.
   5. යථාවාදී තථාකාරී ජීවිතයක් ලෙසයි.

26. ''ලෝකයේ ප්‍රසිද්ධ ආගම්වලින් මා බුදුදහමට විශේෂයෙන් මුල් බුදු දහමට කැමතිවන්නේ එය කිසිවකු පීඩාවට පත් නොකරන බැවිනි.'' බුදුරදුන් පිළිබඳ මෙසේ ඇගයීමට ලක්කරනු ලැබුවේ.
   1. මහාචාර්ය සෝන්ඩස් විසිනි.
   2. එඩ්වින් අර්නෝල්ඩ් විසිනි.
   3. බර්ට්‍රන්ඩ් රසල් විසිනි.
   4. මහාචාර්ය මැක්ස්මුලර් විසිනි
   5. ආචාර්ය සර්ව පල්ලි රාධක්‍රිෂ්ණන් විසිනි.

27. බුදුරජාණන් වහන්සේගේ පරමාදර්ශී ශ්‍රාවකයන් අතර ධර්ම භාණ්ඩාගාරික තනතුර, බහුශ්‍රැත භික්ෂූන් අතර අගතනතුර, ස්මෘති සම්පන්න භික්ෂූන් අතර අගතනතුර, වීර්ය සම්පන්න භික්ෂූන් අතර අග තනතුර ආදී තනතුරු ලැබූ ආනන්ද තෙරුන් වහන්සේගේ පැවිදි ආචාර්යවරයාණන් වූයේ,
   1. පුණ්ණ මන්තානි පුත්ත තෙරුන් වහන්සේ
   2. බෙල්ලට්ඨිසීය තෙරුන් වහන්සේ
   3. මහා මුගලන් තෙරුන් වහන්සේ
   4. මහා කච්චායන තෙරුන් වහන්සේ
   5. මහා කාශ්‍යප තෙරුන් වහන්සේ

28. බුදුරජාණන් වහන්සේ ජීවමාන අවධියේදී රූපාවචර ධ්‍යාන හතරම ලබා ගත් අනාගාමී උපාසකවරයෙක් ලෙස ප්‍රකට වූයේ,
   1. ජීවක වෙදදුරුතුමන් ය.
   2. අනේපිඬු සිටුතුමන් ය.
   3. චිත්ත ගහපතිතුමන් ය.
   4. මහානාම උපාසකතුමන් ය.
   5. හණ්ඩුක උපාසකතුමන් ය.

29. ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව විශේෂ කුසලතා හා ගුණාංග පදනම් කරගෙන බුදුරජාණන් වහන්සේ තනතුරු ප්‍රදානයන් කළ අවස්ථාවන් පිළිබඳ තොරතුරු එතදග්ග පාලිය තුළින් හඳුනාගත හැකි ය. ඒ අනුව නකුල මාතාව ද තනතුරුලාභී උපාසිකාවකි. ඇයට හිමි වූ ශාසනික තනතුර වූයේ,
   1. බහුශ්‍රැත උපාසිකාවන් අතර අග්‍රස්ථානයයි.
   2. මෛත්‍රිය විහරණ ඇති උපාසිකාවන් අතර අග්‍රස්ථානයයි.
   3. පළමුව සරණ ගිය උපාසිකාවන් අතර අග්‍රස්ථානයයි.
   4. විශ්වාස කතා ඇති උපාසිකාවන් අතර අග්‍රස්ථානයයි.
   5. ගිලාන උපස්ථානයෙහි යෙදෙන උපාසිකාවන් අතර අග්‍රස්ථානයයි.

30. පුද්ගලයාගේ ස්වාධීනත්වය, ස්වච්ඡන්දතාව හා වගකීම ප්‍රකට කෙරෙන වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ,
   1. ''තමා උපමාකොට අනුන්ට හිංසා පීඩා නොකළ යුතු ය'' යන්නයි.
   2. ''පව් කරන්නා දෙලොවම තැවෙයි'' යන්නයි.
   3. ''සරුදේ සරු ලෙසත් නිසරු දේ නිසරු ලෙසත් දැකිය යුතු ය'' යන්නයි.
   4. චේතනාව කර්මය වේය'' යන්නයි.
   5. ''තමාට පිහිට තමාමය අන්කිසි පිහිටක් නැත'' යන්නයි.

31. අත්තකාර, පරකාර, ආරම්භක ධාතු, නික්කම ධාතු, පරක්කම ධාතු, ථාම ධාතු, ඨිති ධාතු, උපක්කම ධාතු, යන බෞද්ධ විග්‍රහයන් තුළින් අර්ථවත් ව ඇත්තේ,
   1. තමා පාලනය කරන වෙනත් අදෘෂ්‍යමාන බලවේගයක් ඇති බව ය.
   2. පුද්ගල ශක්තිය හා ස්වාධීනත්වය පුද්ගලයා මත පැවරෙන බව ය.
   3. ඕනෑම ක්‍රියාවක විපාකවලින් මිදිය හැකි බව ය.
   4. ක්‍රියාවක ප්‍රතිඵලය මත කළ යුත්ත නොකළ යුත්ත තීරණය කළ යුතු බව ය.
   5. තමන් උපමාකරගෙන කළ යුත්ත නොකළ යුත්ත තීරණය කළ යුතු බව ය.

32. තිස්ස මධ්‍ය මහා විද්‍යාලයේ බෞද්ධ ශිෂ්‍ය සංගමය මසකට වරක් පැවැත්වේ. එම රැස්වීමේදී අනුශාසකතුමා වැදගත් අනුශාසනාවක් කළේ ය. පහත දැක්වෙන්නේ එයින් උපුටා ගත් කොටසකි.
''ගුණ ගරුක යහපත් දරුවෙක් වීමට නම් තමන් වරදින් වැළකී, අනුන් වරදින් වලක්වා, අනුන් කරන වරදට අනුබල නොදී කටයුතු කළ යුතු ය. මේ අවබෝධය ඇති දරුවා තමාටත් අනුන්ටත් වරදක් නොකරන බව සඳහන් කරන්න පුළුවන්'' මේ තුළින් කියවෙන බෞද්ධ සදාචාර මූලධර්මය වන්නේ,
   1. අත්තූපනායික ධර්ම පර්යායයි
   2. ත්‍රිකෝටික පාරිශුද්ධ ශීලයයි.
   3. පංචසීල ප්‍රතිපත්තියයි.
   4. ත්‍රිවිධ අධිපති ධර්මයයි.
   5. විරතිය හා සමාදානයයි.

33. දීඝ නිකායේ අග්ගඤ්ඤ සූත්‍රයට අනුව මිනිස් සමාජයේ ප්‍රභවය හේතු ඵලවාදීව ඇති වූවකි. එයට අනුව මිනිස් සමාජය තුළ කිසියම් කුල ක්‍රමයක් ඇති වීමට හේතු වී ඇත්තේ ඔවුන්ගේ සමාජ ක්‍රියාකාරකම් හා අවශ්‍යතා සැළකිල්ලට ගැනීමෙනි. එහි සඳහන් ආකාරයට වර්ණ බිහි වූ අනුපිළිවෙළ වන්නේ,
   1. බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍යය, ශුද්‍ර වශයෙනි.
   2. බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, ශුද්‍ර, වෛශ්‍ය වශයෙනි.
   3. වෛශ්‍යය, බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, ශුද්‍ර වශයෙනි
   4. වෛශ්‍යය, බ්‍රාහ්මණ, ශුද්‍ර, ක්ෂත්‍රිය වශයෙනි.
   5. ක්ෂත්‍රිය, බ්‍රාහ්මණ, වෛශ්‍යය, ශුද්‍ර වශයෙනි.

34. අනුන් නො නස්වමින්, නො පරදවමින්, ශෝක ඇති නො කරමින් දැහැමින් රාජ්‍ය පාලනය කළ නො හැකි ද? යනුවෙන් රාජ්‍ය පාලනය සම්බන්ධව මෙබඳු සිතිවිල්ලක් ඇති වූයේ කවුරුන් තුළ ද?
   1. බුදුරජාණන් වහන්සේ තුළ ය.
   2. සැරියුත් මහරහතන් වහන්සේ තුළය.
   3. අශෝක රජතුමා තුළ ය.
   4. කොසොල් රජතුමා තුළ ය.
   5. මොග්ගලී පුත්තතිස්ස මහරහතන් වහන්සේ තුළ ය.

35. යම් පාලකයකු තමා කැමති සිත්ගත් අයට වාසි වන ආකාරයට තීරණ ගනිමින් විනිශ්චයේදී අල්ලස් ආදිය ගෙන වැරදි තීන්දු දීමෙන් කටයුතු කරයි නම් එයින් ප්‍රකට වන්නේ,
   1. පාලකයා කාලානුරූපීව කටයුතු කරන බව ය.
   2. පාලකයා ද්වේශයෙන් අගතියට ගොස් කටයුතු කරන බව ය.
   3. පාලකයා මෝහයෙන් අගතියට ගොස් කටයුතු කරන බවය.
   4. පාලකයා ඡන්දයෙන් අගතියට ගොස් කටයුතු කරන බව ය.
   5. පාලකයා අර්ථචර්යාවෙන් යුක්ත ව කටයුතු කරන බව ය.

36. රාජ්‍ය පාලකයාගේ ප්‍රධාන යුතුකම වන්නේ තම රටවැසියාගේ සුභ සිද්ධිය උදෙසා කටයුතු කිරීමයි. ඒ සඳහා සෑම පාලකයෙක් ම පාහේ විවිධ සැලසුම්, ප්‍රතිපත්ති මත පිහිටා ක්‍රියාත්මක වේ. බුදු දහම මිනිසාගේ පමණක් නොව තිරිසන් ගත සතුන්ගේ ජීවිත සුරක්ෂිතතාව කෙරෙහි ද සැලකිලිමත් වී ඇත. එයට අදාළ බෞද්ධ ඉගැන්වීමක් දැක ගත හැකි වන්නේ,
   1. දසරාජ ධර්ම වලිනි.
   2. සතර සංග්‍රහ වස්තු තුළිනි.
   3. දස සක්විතිවත් තුළිනි.
   4. සතර බ්‍රහ්ම විහරණ තුළිනි.
   5. සප්ත අපරිහානීය ධර්ම තුළිනි.

37. බුදු දහමට අනුව හොඳ නරක විනිශ්චයට අදාල නිර්නායක ගණනාවක් බෞද්ධ සූත්‍ර ධර්මවලදී දැක ගත හැකිය. අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රය එයින් එකකි. එහි සඳහන් හොඳ නරක විනිශ්චයට අදාල මූලික කරුණු වලින් එකක් වන්නේ,
   1. තමාගේ හෘද සාක්ෂියට අනුව විමසා බලා කටයුතු කිරීම
   2. ක්‍රියාවේ ප්‍රතිඵලය දෙස බලා හොඳ නරක තීරණය කිරීම.
   3. නුවණැත්තන් විසින් ගරහන හා ප්‍රශංසා කරනු පිළිබඳව අවධානය යොමු කොට තීරණය කිරීම.
   4. තර්කයට අනුගත නිසා පිළිගත යුතුයැයි තීරණය කිරීම ය.
   5. තමන්ට හා අනුන්ට යන දෙපාර්ශවයටම හිත පිණිස හේතුවේද අහිත පිණිස හේතුවේද යන්න විමසා බලා තීරණය කිරීම.

38. පහත සඳහන් ශික්ෂාපද අතරින් උපෝසථ අෂ්ටාංග සීලය අයත් වන්නේ,
   1. පිසුණාවාචා වේරමණී සික්ඛා පදං සමාදියාමි යන්නයි.
   2. කාමේසු මිච්ඡාචාරා වේරමණී සික්ඛා පදං සමාදියාමී යන්නයි.
   3. නච්චගීතවාදිත විසූක දස්සනා වේරමණී සික්ඛාපදං සමාදියාමි යන්නයි.
   4. මුසාවාදා වේරමණී සික්ඛා පදං සමාදියාමි යන්නයි.
   5. මලාගන්ධ විලේපන ධාරනමණ්ඩන විභූසණට්ඨානා වේරමණී සික්ඛාපදං සමාදියායි යන්නයි.

39. සිරිමත් අළුයම නැගිට ගෙවල් මිදුල් ඇමඳ, තම පිරිසිදුවීම් කටයුතුවල නිරත ව, නිවසේ බුද්ධ ප්‍රතිමාව අබියස මල් පහන් පුදා දෙමව්පියන් නැමැද උදෑසන ම පාසල් යන ශිෂ්‍යයෙකි. මොහුගේ මෙම චර්යා රටාවන් දසපුණ්‍ය ක්‍රියාවල කුමන ක්‍රියාවන්ට ඇතුලත් වේද?
   1. වෙයාාවච්චයට හා අපචායනයට ඇතුළත් වේ.
   2. පත්තිදානයට හා අපචායනයට ඇතුළත් වේ.
   3. වෙයාාවච්චයට හා පත්තානුමෝදනාවට ඇතුලත් වේ.
   4. වෙයාාවච්චයට හා පත්තානුමෝදනාවට ඇතුලත් වේ.
   5. පත්තිදානයට හා පත්තානුමෝදනාවට ඇතුළත් වේ.

40. සෞන්දර්ය රසාස්වාදය බුදු සමයට අනුව අනුචිත වූවක් නොවේ. බුදුරජාණන් වහන්සේ මෙන් ම විරාගී යතිවරුන් ද නිරාමිස සෞන්දර්ය අගය කළ අවස්ථා සූත්‍රපිටකය තුළින් හඳුනාගත හැකි ය. නමුත් බුදු දහම තුළ සෞන්දර්ය රසාස්වාදයේ මූලික ආකල්පය වී ඇත්තේ,
   1. සාමිස සැප ළඟා කර ගැනීමේ ආකල්පයයි.
   2. අනුත්සුක හා අනුපාදන ආකල්පයයි
   3. ඉන්ද්‍රිය පිනවීමේ ආකල්පයයි.
   4. ප්‍රසාදය වැඩිදියුණු කිරීමේ ආකල්පයයි.
   5. සුඛාස්වාදය විඳ ගැනීමේ ආකල්පයයි.

41. සදාචාරාත්මක ජීවිතය පලුදු නොවන පරිදි ආර්ථිකය හැඩ ගසා ගැනීමට හැකි වන්නේ පරිභෝජන දර්ශනයක් ඇතිව පුද්ගලයා කටයුතු කරන්නේ නම් පමණි. බුදු සමයේ ඉදිරිපත් වන එම සම්පත් පරිභෝජන දර්ශනයේ අමුච්ඡිතව පරිභෝජනය කිරීම යන්නෙන් අර්ථවත් වනුයේ,
   1. මුළා නොවී සම්පත් පරිභෝජනය කිරීමයි.
   2. ආදීනව දකිමින් සම්පත් පරිභෝජනය කිරීමයි.
   3. නො ඇලී සම්පත් පරිභෝජනය කිරීමයි
   4. අත්හැරයාමේ නුවණින් යුතුව සම්පත් පරිභෝජනය කිරීමයි.
   5. දැඩි සේ ඇබ්බැහි නොවී සම්පත් පරිභෝජනය කිරීමයි.

42. පොදු භාණ්ඩ විනාශයට නොදී සුරක්ෂිතව තබා ගැනීම තෘෂ්ණාවෙන් තොර ව ප්‍රවේශමෙන් පරිහරණය කිරීමට විනය පිටකයේ මහාවග්ග පාලියේදී භික්ෂු සමාජය තුළ නිලධාරී මණ්ඩලයක් ද පත් කර ඇත. එහි යාගුභාජක ලෙස නම් කර ඇත්තේ,
   1. ආහාර බෙදන්නා ය.
   2. ආදිකම්මිකයා ය.
   3. කැඳ බෙදන්නා ය.
   4. සෙනසුන් පනවන්නා ය.
   5. චීවර බෙදන්නා ය.

43. බෞද්ධ විමුක්ති මාර්ගය අනුපූර්ව ශික්ෂණයක් වන හෙයින් අපේක්ෂිත අරමුණ වූ විමුක්ති කාරක ප්‍රඥාව ලබා ගන්නේ ශ්‍රද්ධාවෙන් ආරම්භ කොට ක්‍රමානුකූලව ප්‍රතිපදා මාර්ගයේ ඉදිරියට ගමන් කිරීමෙනි. ප්‍රඥා ප්‍රතිලාභය සමඟ එහි කාර්ය අවසන් වෙයි. බුදු දහම තුළ අස්සද්ධ යනුවෙන් හඳුන්වන්නේ,
 1. පෘතග්ජනයා ය.  2. සෝවාන් පුද්ගලයා ය.  3. අනාගාමී පුද්ගලයාය.
 4. සකෘදාගාමී පුද්ගලයාය.  5. රහත් වහන්සේ ය.

44. යහපත්හාමි ධාර්මික ගොවි මහතෙකි. උත්සාහයෙන් හා අධිෂ්ඨානයෙන් සිය ගොවිතැන්හි අප්‍රමාදව කටයුතු කරන ඔහු සිය ශක්ති ප්‍රමාණයෙන් දරු පවුල පෝෂණය කරයි. සමාජ යුතුකම් ද ඉටු කරයි. තරගකාරී සමාජයක ජීවත් වුව ද තම උවමනාවන් වැඩි කර ගැනීමට ක්‍රියා නො කළේ ඒ සඳහා ප්‍රමාණවත් ධනයක් නො තිබුණ නිසා ම නොව ආශාවන් පසුපස හඹා යාම අවසානයක් නො පෙනෙන කටයුත්තක් ලෙසට ඔහුට යම් වැටහීමක් තිබූ නිසා ය. යහපත්හාමි ගොවි මහතාගේ ආකල්ප හා ක්‍රියාකාරිත්වය තුළින් හඳුනාගත හැකි බෞද්ධ චින්තනය වන්නේ,
 1. අල්පේච්ඡතාවයි.  2. අල්පකෘත්‍යතාවයි.  3. මහේච්ඡතාවයි.
 4. බහුකිච්ඡතාවයි.  5. පාපිච්ඡතාවයි

45. සාර්ථක ගිහි ජීවිතයක පැවැත්ම සඳහා අත්ථි සුඛ, භෝග සුඛ, අණන සුඛ, අණවජ්ජ සුඛ යන සිව් වැදෑරුම් ලෞකික සුඛ අවශ්‍ය බව බුදු දහම පෙන්වා දෙයි. මේ අතරින් භෝග සුඛය නමින් හැඳින්වෙන්නේ,
 1. ධාර්මිකව උපයාගත් සම්පත් තමන් සතුව ඇතැ යි ලබන සතුටයි.
 2. ධාර්මිකව උපයාගත් සම්පත් තම දූ පුතුන්ට බෙදා දී ලබන සතුටයි.
 3. ධාර්මිකව උපයාගත් සම්පත් තමන් දානාදී යහපත් කටයුතු සඳහා වැය කිරීමෙන් ලබන සතුටයි.
 4. ණය නොවී උපයාගත් සම්පත් තමන් සතුව ඇතැයි ලබන සතුටයි.
 5. ධාර්මිකව උපයාගත් සම්පත් අර්ථවත්ව වැය කරමින් මැනවින් පරිභෝග කරමින් ලබන සතුටයි.

46. ධන පරිහරණයේදී නොකා නොබී මිය යන අජද්ධුමාරික ක්‍රමයත්, දිඹුල් ගසේ අතු සොළවා දිඹුල් කඩා කන්නෙකු මෙන් ක්‍රියා කරන උදුම්බර ඛාදිත ක්‍රමයත් බුදුදහමින් ප්‍රතික්ෂේප කරයි. ඒ වෙනුවට ව්‍යග්ඝපජ්ජ සූත්‍රය තුළින් නිර්දේශිත ක්‍රියාවලිය වන්නේ,
 1. ආරක්ඛ සම්පදාවයි.  2. කල්‍යානමිත්තාවයි.  3. සමජීවිකතාවයි.
 4. උට්ඨානසම්පදාවයි.  5. පඤ්ඤා සම්පදාවයි.

47. ගෘහස්ථ ජීවිතයක සාර්ථකත්වය සඳහා ආර්ථික සමෘද්ධිය අවශ්‍යම සාධකයක් බව බුදු දහම පිළිගනී. උට්ඨාන සම්පදාවෙන් නිර්දේශ කරන්නේ අලස නොවී උත්සාහවන්තව අප්‍රමාදීව කටයුතු කොට ශක්තිමත් ආර්ථිකයක් ඇති කරගත යුතු අකාරයයි. ආර්ථික සමෘද්ධිය සඳහා ධානාත්මක අවධානයක් යොමු කරන බුදු සමය ධනය ඉපැයීමට අදාළව අත්‍යවශ්‍ය වන ගුණාත්මක සීමාද දක්වා තිබේ. එවැනි සීමා දෙකක් ලෙස සැලකිය හැක්කේ,
 1. අප්‍රමාදී බව හා උත්සාහයයි.  2. වෙළදාමෙහි හා කෘෂිකර්මාන්තයේ යෙදීමයි.
 3. අනලස් බව හා සත්‍යවාදී වීමයි.  4. ධාර්මිකත්වය හා අසාහසිකත්වයයි.
 5. .කායික ශ්‍රමය හා මානසික ශක්තිය යෙදවීමයි.

48. පරිසරය දූෂණය වීම නිසා විවිධ සමාජ ගැටලු පැන නගී. බුදු දහම පරිසර සුරක්ෂිතතාව තහවුරු කර ඇත. ඒ බව ත්‍රිපිටකාගත ඉගැන්වීම් විමසා බැලීමෙන් මනාව පැහැදිලි වේ. මේ කරුණු සනාථ කරන සූත්‍රය වන්නේ,
 1. චංකි සූත්‍රය  2.සිගාලෝවාද සූත්‍රය  3. වනරෝපා සූත්‍රය  4. වේළුද්වාර සූත්‍රය
 5. මංගල සූත්‍රය

49. බෞද්ධ දර්ශනය පිළිබඳව පෙරදිග අපරදිග රටවල ඇතැම් උගතුන් යම් යම් අදහස් ඉදිරිපත් කර ඇත. ඒවායින් ඇතැම් අදහස් බෞද්ධ දර්ශනය නිවැරදිව අවබෝධ කර නො ගැනීම නිසා ඉදිරිපත් වූ ඒවා බව හැඟේ. පහත සඳහන් කරුණුවලින් බෞද්ධ දර්ශනයට වඩාත් අනුරූපී ඉදිරිපත් වීම වන්නේ,
 1. බුදුරදුන් ආර්ථික දේශපාලනික කරුණු සම්බන්ධයෙන් සම්පූර්ණයෙන්ම නිහඬ වූහ.
 2. අංග සම්පූර්ණ ආර්ථික දේශපාලනික දර්ශනයක් ඉදිරිපපත් කළ යහ.
 3. ආර්ථික කරුණු සම්බන්ධයෙන් නිහඬ වූ අතර පූර්ණ දේශපාලන දර්ශනයක් ඉදිරිපත් කළ හ.
 4. රටක ආර්ථික හා දේශපාලන දර්ශනය සකසා ගැනීමට ප්‍රයෝජනවත් අදහස් ඉදිරිපත් කළ හ.
 5. දේශපාලන කරුණු සම්බන්ධයෙන් නිහඬ වූ අතර පූර්ණ ආර්ථික දර්ශනයක් ඉදිරිපත් කළ හ.

50. සම්පත් කළමනාකරණය මෙන් ම සංරක්ෂණය පිළිබඳවත් වැදගත් උපදේශයක් අංගුත්තර නිකායේ කුල සූත්‍රයේ දක්වේ. එහි සඳහන් කරුණුවලට අමතරව දක්වා ඇත්තේ,
 1. නැසුන සම්පත් ඉපයීම
 2. දිරායන දේ ප්‍රතිසංස්කරණය කිරීම.
 3. සම්පත් සංරක්ෂණයට කටයුතු කිරීම
 4. පරිභොජනයේ සීමා දැන ගැනීම
 5. නිවසක ආධිපත්‍ය දරන පිරිමියා හෝ ගැහැනිය සිල්වත් වීම.

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## தென் மாகாணக் கல்வித் திணைக்களம்
## Southern Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) 12 ශ්‍රේණිය, තුන්වන වාර පරීක්ෂණය, 2019 ජූලි
**General Certificate of Education (Adv. Level), Grade 12, Third Term Test, July 2019**

**බෞද්ධ ශිෂ්ටාචාරය - I**
**Buddhist Civilization - I**

45 | S | II

පැය 03 යි
03 hours

විභාග අංකය:.....................................................................

- **උපදෙස් i කොටසින් ප්‍රශ්න දෙකක් ද ii කොටසින් ප්‍රශ්න තුනක් ද තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

## I කොටස

මෙම කොටසින් ප්‍රශ්න දෙකක් පමණක් තෝරාගෙන පිළිතුරු සපයන්න.

01. (i) චතුර් වර්ණයේ දිව්‍යමය ප්‍රභවය පිළිබඳ බ්‍රාහ්මණ ඉගැන්වීම් ගෙනහැර දක්වන්න.
(ii) ක්ෂත්‍රිය වර්ණයේ ප්‍රභවය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් ගෙන හැර දක්වන්න.
(iii) කාන්තාව පුරුෂාධිපත්‍යයට නතුකරලීම සඳහා බමුණන් ගත් ක්‍රියා මාර්ග පෙන්වා දෙන්න.
(iv) අජිත කේෂකම්බලී ශාස්තෘවරයාගේ දස වස්තුක දෘෂ්ටිය පෙන්වා දෙන්න.
(v) එම ඉගැන්වීම් බුදුදහමින් ප්‍රතික්ෂේප වන්නේ කවර හේතූන් නිසාදැ යි පහදන්න.

02. (i) ''සත්ථා දේව මනුස්සානං'' (දෙවි මිනිසුන්ට ශාස්තෘවරයා) යන බුදු ගුණය හඳුන්වන්න.
(ii) දැඩි නීතිරීති පැණවීමෙන් සිය ශ්‍රාවකයන් පාලනය කිරීමට බුදුරදුන් උත්සහ නොගත් ආකාරය කෙටියෙන් දක්වන්න.
(iii) බුදුරජාණන් වහන්සේ උපමානුසාරී ව දහම් දේශනා කළ අවස්ථාවන් හතරක් පෙන්වා දෙන්න.
(iv) නිදහස් චින්තනයට බුදු දහමින් ලබා දී ඇති තැන නිදසුන් හතරක් මඟින් පෙන්වා දෙන්න.
(v) විශාඛා මහෝපාසිකාවගෙන් ඉටු වූ ශාසනික සේවාවන් හතරක් ඉදිරිපත් කරන්න.

03. (i) දස පුණ්‍යක්‍රියා පිළිවෙළින් නම් කරන්න.
(ii) සමජීවිකතාව පිළිබඳව ධර්මානුකූල විවරණයක් සපයන්න.
(iii) ආකාරවතී සද්ධාව යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැ යි පැහැදිලි කරන්න.
(iv) වත්ස රාජ්‍යය පිළිබඳ හැඳින්වීමක් කරන්න.
(v) බුද්ධකාලීන භාරතයේ වෙළඳාමට හිමිතැන නිදසුන් හතරක් මගින් පැහැදිලි කරන්න.

## II කොටස

04. (i) ප්‍රජාව රක්ෂණය හා පෝෂණය කිරීම පාලකයාගේ මූලික වගකීමක් බව බෞද්ධ දේශපාලන මූලධර්ම ඇසුරෙන් පහදන්න.
(ii) ජීවන ගැටළු අවම කර ගැනීමෙහිලා, අල්පේච්ඡතාවයේ කාලීන වටිනාකම ඇගයීමට ලක් කරන්න.

05. (i) ධන පරිභෝජනය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් සමාජ සංවර්ධනයට හා සහජීවනයට ඉවහල් වන අයුරු පෙන්වා දෙන්න.
(ii) හොඳ නරක විනිශ්චයට අදාල බෞද්ධ නිර්නායකවල පවත්නා ප්‍රායෝගික වැදගත්කම පිරික්සන්න.

06 (i) සෞන්දර්ය රසාස්වාදය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් පුද්ගල ජීවිතයේ ගුණාත්මක සංවර්ධනය සඳහා ඉවහල් කරගත හැකි ආකාරය විමර්ශනය කරන්න.
(ii) වර්තමානයේ පැනනැගී ඇති පරිසර ගැටළු අවම කර ගැනීමට ඇතැම් බෞද්ධ ඉගැන්වීම් උපකාරී වන අයුරු සාකච්ඡා කරන්න.

07. (i) ''අරපිරිමැස්ම'' සම්පත් කළමණාකරණයේදී නූතන කළමණාකරුවන්ගේ ද විශේෂ අවධානයට යොමු වන බැවින් එයට අදාළ බෞද්ධ ඉගැන්වීම් ගෙන හැර දක්වන්න.
(ii) සදාචාරාත්මක සංවර්ධනය උදෙසා නීතිගරුකත්වයේ ඇති වැදගත්කම බෞද්ධ ඉගැන්වීම් ඇසුරෙන් පහදන්න.

08. (i) පුද්ගලයාගේ මෙළොව අභිවෘද්ධිය උදාකරලීමට අණන සූත්‍රයේ දැක්වෙන චතුර්විධ සුඛයෙහි කාලීන වැදගත්කම පෙන්වා දෙන්න.
(ii) වෙහෙස වී වැඩ කිරීම මෙන් ම විවේක ගැනීම ද මිනිසුන්ට අවශ්‍ය බව ධර්මානුකූලව පෙන්වා දෙන්න.

Answer

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
**Southern Provincial Department of Education**

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) 12 ශ්‍රේණිය, තුන්වන වාර පරීක්ෂණ, 2019 ජූලි
**General Certificate of Education (Adv. Level), Grade 12, Third Term Test, July 2019**

**බෞද්ධ ශිෂ්ටාචාරය - I**
**Buddhist Civilization - I**

45 | S | I, II

පිළිතුරු පත්‍රය

I **පත්‍රය**

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1. 4 | 2. 2 | 3. 3 | 4. 5 | 5. 1 | 6. 2 | 7. 1 | 8. 5 | 9. 2 | 10. 1 |
| 11. 4 | 12. 3 | 13. 4 | 14. 1 | 15. 5 | 16. 5 | 17. 4 | 18. 3 | 19. 2 | 20. 1 |
| 21. 4 | 22. 2 | 23. 5 | 24. 1 | 25. 3 | 26. 3 | 27. 1 | 28. 3 | 29. 4 | 30. 5 |
| 31. 2 | 32. 2 | 33. 5 | 34. 1 | 35. 4 | 36. 3 | 37. 5 | 38. 4 | 39. 1 | 40. 2 |
| 41. 1 | 42. 3 | 43. 5 | 44. 1 | 45. 5 | 46. 3 | 47. 4 | 48. 4 | 49. 2 | 50. 3 |

ii **කොටස**

01. (i) චතුර් වර්ණයේ දිව්‍යමය ප්‍රභවය පිළිබඳ බ්‍රාහ්මණ ඉගැන්වීම් ගෙන හැර දක්වන්න

- බ්‍රාහ්මණයන් වර්ණ ධර්ම පදනම් කොටගෙන සමාජ ප්‍රභවය ඉගැන් වූ බව
- එම ඉගැන්වීම් ඍග් වේදයේ 10 වන මණ්ඩලයේ 90 වන පුරුෂ සූක්තයේ සඳහන් බව

''බ්‍රාහ්මණෝස්‍ය මුඛමාසිද් බාහු රාජන්‍යඃ කෘතඃ
ඌරුතදස්‍ය යද් වෛශ්‍යඃ පද්භ්‍යාම් ශූද්‍රෝ අජායත'' (ඍග් 10.90)

- මෙම ඉගැන්වීම වර්ණ ධර්ම නමින් හැඳින් වූ බව
- බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය හා ශූද්‍ර යන සමාජ සංස්ථා හතර චතුර් වර්ණය නම් වන බව

(ii) ක්ෂත්‍රිය වර්ණයේ ප්‍රභවය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් ගෙන හැර දක්වන්න.

- දීඝ නිකායේ අග්ගඤ්ඤ සූත්‍රයේ ක්ෂත්‍රිය වර්ණයේ බිහිවීම පිළිබඳව තොරතුරු වාර්තා වේ.
- කෙත්වලට අධිපති නිසා ක්ෂත්‍රිය වූ බව
- මහජනතාවගේ කැමැත්ත මත පාලකයා පත් වූ නිසා මහා සම්මත නම් වූ බව
- ධර්මයෙන් ජනතාව රංජනය කරන නිසා ඔහුව රජ යන නමින් හැඳින් වූ බව

(iii) කාන්තාව පුරුෂාධිපත්‍යයට නතු කරලීම සඳහා බමුණන් ගත් ක්‍රියාමාර්ග පෙන්වා දෙන්න.

- සති පූජාව සිදු කිරීම, පර්ධා චාරිත්‍රයට යොමු කිරීම.
- කාන්තාව ළමා කාලයේ පියා යටතේත්, විවාහ වූ පසු ස්වාමියා යටතේත්, ස්වාමියා මළ පසු පිරිමි දරුවන් යටතේත් සිටීමට නිර්දේශ කර තිබීම.
- කාන්තාව ස්වර්ගයට යාමට ඇති එකම මාර්ගය ලෙස ස්වාමියා කෙරෙහි පති භක්තියෙන් සිටීම ප්‍රමාණවත් වන බව දක්වා තිබීම.

(iv) අජිත කේෂකම්බලී ශාස්තෘවරයාගේ දස වස්තුක දෘෂ්ටිය පෙන්වා දෙන්න.

1. නත්ථි මහරාජ දින්නං - දානයෙහි විපාක නැත
2. නත්ථි යිට්ඨං - යාගයෙහි විපාක නැත
3. නත්ථි හුතං - හෝමයෙහි විපාක නැත
4. නත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකෝ - හොඳ නරක ක්‍රියාවල විපාක නැත.
5. නත්ථි අයං ලෝකෝ - මොළොවක් නැත
6. නත්ථි පරලොකෝ - පරලොවක් නැත
7. නත්ථි මාතා - මවක් නැත
8. නත්ථි පිතා - පියෙක් නැත
9. නත්ථි සත්තා, ඕපපාතිකා - ඕපපාතික සත්වයෙක් නැත
10. නත්ථි ලොකේ සමණ බ්‍රාහ්මණා - නිවැරදි මඟට පිළිපන් ශ්‍රමණ බ්‍රාහ්මණයෙක් නැත.

(v) එම ඉගැන්වීම් බුදු දහමින් ප්‍රතික්ෂේප වන්නේ කවර හේතුන් නිසාද යි පහදන්න.

- ''ලෝකසමුදයං බෝ කච්චාන සම්මප්පඤ්ඤාය පස්සතෝ යා ලොකේ නත්ථිතා සා නා හෝති'' යනුවෙන් පටිච්චසමුප්පන්න ව සත්ත්වයාගේ, ලෝකයේ හට ගැනීම හා පැවැත්ම මනා වූ නුවණින් දකින්නාට නාස්තික දෘෂ්ටිය හෙවත් උච්ඡේද දෘෂ්ටිය ඇති නො වන බව.
- සත්ත්වයාගේ පැවැත්ම මරණයෙන් අවසන් නො වන්නේ යැයි අවධාරණය කරන බුදුසමය පුනර්භවය පිළිගන්නා බව.
- කර්ම විපාක සිද්ධාන්තය පිළිගන්නා බුදුසමය පුද්ගලයා විසින් සචේතනව කරනු ලබන කුසලාකුසල කර්මයන්ගේ ඵලවිපාක දිට්ඨධම්මවේදනීය, උපපජ්ජවේදනීය, අපරාපරියවේදනීය ආදී වශයෙන් සංසාරගත ජීවිතය තුළ දී විදීමට සිදුවෙති යි පවසන බව.
- නත්ථි දින්නං නත්ථි යිට්ඨං..... ආදී දසවස්තුව මිථ්‍යාදෘෂ්ටියක් ලෙස බැහැර කරන බුදුසමය අත්ථි දින්නං අත්ථි යිට්ඨං අත්ථි හුතං, අත්ථි සුකටදුක්කටානං ඵල විපාකෝ....... යනාදි දසවස්තුක සම්මා දිට්ඨියක් මහාචත්තාරිස ආදී සූත්‍රයන්හි දක්වා ඇති බව.
- දානාදි සත්ක්‍රියාවල ඵල විපාක ප්‍රතික්ෂේප කිරීම හා සත්ත්වයාගේ සාංසාරික පැවැත්ම බැහැර කිරීම යන අජිත කේසකම්බලී ශාස්තෘවරයාගේ ඉගැන්වීම් සමාජ සදාචාරයෙහි පැවැත්මට ප්‍රබල බාධකයක් බව.

2. (i) ''සත්ථා දේව මනුස්සානං'' දෙවි මිනිසුන්ට ශාස්තෘවරයා) යන බුදු ගුණය හඳුන්වන්න.

- දෙවියන් සහිත ලෝකයාට දිට්ඨධම්මික සම්පරායික යන උභයාර්ථ සිද්ධිය පිණිස අනුශාසනා කරන බැවින් ද (සදෙවකෙ ලොකෙ සාසතීති සත්ථා) දෙවි මිනිසුන්ට ශාස්තෘවරයා මෙන් ම ගුරුවරයා වන බැවින් ද, බුදු රජාණන් වහන්සේ 'සත්ථා' (සත්ථාදේව මනුස්සානං) යනුවෙන් හැඳින්වෙන බව.
- බව කතරින් එතර - ලනුයෙන් සතර හැම වර
- තිලෝගුරු මුනිවර - විය සත්තා නමින් පුවතර

(ii) දඩි නීතිරීති පැණවීමෙන් සිය ශ්‍රාවකයන් පාලනය කිරීමට බුදුරදුන් උත්සහ නොගත් ආකාරය කෙටියෙන් දක්වන්න.

- සසුනට වසර විස්සක් වැනි දිගුකලක් ගතවනතුරු නීති නො පැණවීම.
- සසුනේ චිර පැවැත්ම, සංඝයාගේ පහසුව ආදී කරුණුත් ආසවට්ඨානීය කරුණුත් මුල් කරගෙන විනය නීති පැනවීමට යොමු වූ බව.
- පැනවූ නීති පවා වරින් වර සංස්කරණයන්ට ලක් කිරීම.
- අවශ්‍ය නම් භික්ෂූන් වහන්සේලාට බුද්දානු බුද්දක ශික්ෂා පද වෙනස් කර ගැනීමට අනුමැතිය ලබා දීම.
- ඕවාද ප්‍රාතිමෝක්ෂයට අනුව භික්ෂූන් වහන්සේලාගේ හික්මීම ඇති කරලීමට කටයුතු කිරීම.

(iii) බුදුරජාණන් වහන්සේ උපමානුසාරීව දහම් දේශනා කළ අවස්ථාවන් හතරක් පෙන්වා දෙන්න.

- උපමා භාවිත කරමින් දහම් කරුණු සන්නිවේදනය කිරීමට බුදුරජාණන් වහන්සේ තරම් සමත්කම් දක් වූ වෙනත් ශාස්තෘවරයෙක් ලෝක ඉතිහාසයේ නො මැත.
- උන්වහන්සේ එදිනෙදා ජීවිතයේ නෙත ගැටෙන පරිසරයෙන් උපමා ගෙනහැර දැක්වූහ. (චක්කං ච වහතෝ පදං, බලිවද්දෝ ච ජීරති, මධුවා මඤ්ඤති බාලෝ, ඡායාව අනපායිනී, කුම්භූපමං කායමිමංවිදිත්වා, නාගරූපමං චිත්තමිදං, ඨාපෙත්වා)
- උලගද්දූපම සූත්‍රයේ දී පහුර උපමාව ලෙස භාවිතා කිරීම.
- සෝණ සූත්‍රයේදී ඇට්ටේරියා කොළ උපමාවට ගැනීම
- චුල්ලහත්ථිපදෝපම සූත්‍රයේදී ඇත්පාද උපමාකොට ගැනීම ආදී වශයෙන් උපමා හතරක්වත් දක්වමින් පිළිතුර ගොනුවිය යුතු ය.

(iv) නිදහස් චින්තනයට බුදුදහමින් ලබා දී ඇති තැන නිදසුන් හතරක් මගින් පෙන්වා දෙන්න.

- කේසපුත්ත නියම්ගම වැසි කාලාම ගෝත්‍රිකයන්ට නිදහසේ සිතා විමසා තීරණය ගැනීමට අනුශාසනා කළ බව.
- තමන් වහන්සේ පිළිබඳව වුව ද විමසා බලා ම පිළිගැනීමට මඟ පෙන් වූ බව.
- තෙරුවන් ගුණ වුව ද විමසා බලාම ප්‍රසාදය ඇතිකර ගත යුතුයැයි ඇත් අඩි උපමාවෙන් පෙන්වා දුන් බව.
- තමන් වහන්සේ වෙත පැමිණෙන්නවුන්ට විමසීමට ඉඩකඩ ලබාදෙන උතුම් ශාස්තෘවරයකු ලෙස සභිය පිරිවැජියාගේ ඇගයීමට බුදුරජාණන් වහන්සේ ලක් වූ බව.

(v) විශාඛා මහෝපාසිකාවගෙන් ඉටු වූ ශාසනික සේවාවන් හතරක් ඉදිරිපත් කරන්න.
- භික්ෂූන් වහන්සේලාට හා භික්ෂුණීන් වහන්සේලාට වැසි සළු, ආගන්තුක බත, ගමික බත, ගිලන් බත, උවටැන් බත, බෙහෙත් කැඳ ආදියෙන් උවටැන් කිරීම නිසා උභය සංඝයාගේ මාතාව වූ බව.
- බුදුරදුන්ටත්, භික්ෂූන් වහන්සේලාටත්, සිවුපසයෙන් උපස්ථාන කළ ඇය කුඩා සාමණේර ස්වාමීන් වහන්සේලාට විශේෂ ළැදියාවක් දක් වූ බව.
- තම ස්වාමියාගේ පියාණන් වූ මිගාර සිටුතුමාට ධර්මාවබෝධය සඳහා මඟ පෙන් වූ බැවින් මිගාරමාතා නමින් ප්‍රකට වූ බව.
- දන්දීමේ අලුණු උපාසිකාවන් අතර අග තනතුර ලබා සිටි බව
- තමා සන්තකව තිබූ මහා මේල පලඳනාව නම් ආභරණය අලෙවි කොට පූර්වාරාමය තනා සඟ සතු කොට පිදූ බව.
- කුමාර කස්සප මාතාව පිළිබඳ ගැටලුව විසඳීමට බුදුරදුන් විසින් ඇය පත්කරනු ලැබූ කල්හි එය මැනවින් ඉටු කළ බව.

3. (i) දස පුණ්‍ය ක්‍රියා පිළිවෙලින් නම් කරන්න.
දාන, සීල, භාවනා, පත්තිදාන, පත්තානුමෝදනා යනාදි වශයෙන් දැක්වෙන දස පුණ්‍යක්‍රියා පිළිවෙලින් දක්වා තිබීම ප්‍රමාණවත්.

(ii) සමජීවිකතාව පිළිබඳව ධර්මානුකූල විවරණයක් සපයන්න.
ව්‍යග්ගපජ්ජ සූත්‍රයෙහි සමජීවිතාව විග්‍රහකොට ඇත්තේ ''ව්‍යග්ගපජ්ජය මේ ලෝකයෙහි කුල පුත්‍රයෙක් භෝගයන්ගේ වස්තූන්ගේ අය ද වැය ද දැන ඉතා වැඩිත් නො කොට අඩුත් නො කොට සමව දිවි ගෙවයි. මෙසේ මාගේ අය වැය ඉක්මවා සිටී. මෙසේ මාගේ වැය ඉක්මවා නො සිටී.''යනාදි කරුණු ඇතුළත් විස්තරයක් ඉදිරිපත් විය යුතු ය.

(iii) ආකාරවතී සද්ධාව යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද යි පැහැදිලි කරන්න.
- බුද්ධාදි රත්නත්‍රයේ ගුණ දැක දැන එය අවබෝධය මත ඇති කරගන්නා පැහැදීම අකාරවතී ශ්‍රද්ධාව වන බව.
- අවශ්‍යයෙන් ම බෞද්ධයකු තුළ තෙරුවන් පිළිබඳ ශ්‍රද්ධාව පැවතිය යුතු බව.
- ශ්‍රද්ධාව බෞද්ධ ප්‍රතිපදාව අනුගමනය කිරීමටත්, ඥාන ප්‍රතිලාභය පිණිසත් පුද්ගලයා පොළඹවන මනෝභාවයක් බව.
- බෞද්ධ ශ්‍රද්ධාව ප්‍රඥාවෙන් තොර වූවක් නො වන බව

(iv) වත්ස රාජ්‍ය පිළිබඳ හැඳින්වීමක් කරන්න.
- ඝෝෂිතාරාමය, කුක්කුටාරාමය, පාවාරිකාරාමය, බදරිකාරාමය වැනි බෞද්ධ ආරාම පිහිටා තිබීම.
- බුදුරදුන් නව වන වස්කාලය කොසඹෑ නුවර ඝෝෂිතාරාමයේ වස් විසීම.
- ධර්මධර හා විනයධර භික්ෂූන් අතර ගැටුම
- සාමාවතී හා ඛුජ්ජුත්තරා ප්‍රබල උපාසිකාවන් ව සිටි බව
- භග්ග ජනපදය වත්ස රාජ්‍යයට ඇතුළත් වූ අතර එහි සුංසුමාරගිරි නුවර සමීපයේ භේෂකලා වනයේ බුදුරදුන් අටවන වස්කාලය විසූ බව
- පිණ්ඩෝල භාරද්වාජ තෙරුන්ගෙන් බණ අසා පැහැදී උදේන රජු බෞද්ධයකු වූ බව.

(v) බුද්ධකාලීන භාරතයේ වෙළඳාමට හිමිතැන නිදසුන් හතරක් මඟින් පැහැදිලි කරන්න.
- වෙළඳාම දේශීය වශයෙන් මෙන් ම විදේශීය වශයෙන් ද පැවැතීම
- හුවමාරු මාධ්‍යයක් වශයෙන් මිල මුදල් භාවිතයට යොමු වීම.
- වනිජ්ජා වැනි වෙළඳ ශ්‍රේණි ඇතිවීම.
- භාරුකච්ච, සුප්පාරක හා තාම්‍රලිප්ත වශයෙන් ජගත් කීර්තියට පත් වෙළඳ වරායවල් ඇතිවීම.
- ප්‍රසිද්ධ වෙළඳ නගර හා වෙළඳ මාර්ග ඇති වීම.

## II කොටස

4. (i) ප්‍රජාව රක්ෂණය හා පෝෂණය කිරීම පාලකයාගේ මූලික වගකීමක් බව බෞද්ධ දේශපාලන මූලධර්ම ඇසුරෙන් පහදන්න.
- දීඝ නිකායේ අග්ගඤ්ඤ සූත්‍රය, චක්කවත්ති සීහනාද, කූටදන්ත යන සූත්‍රවල දැක්වෙන ප්‍රජාව ආරක්ෂා කිරීමට හා පෝෂණය කිරීමට අදාල කරුණු සඳහන් විය යුතු ය.
- අග්ගඤ්ඤ සූත්‍රයට අනුව ජනතාවගේ කෙත්වතු ආරක්ෂා කිරීම, වැරදිකරුවන්ට දඬුවම් දීම, ජනතාව ධාර්මිකත්වයට යොමු කිරීම.

- චක්කවත්ති සීහ නාද සූත්‍රයේ දක්වෙන ආකාරයට දස සක්විතිවත් තුළින් ප්‍රජා රක්ෂණයට හා පෝෂණයට අවස්ථාව උදාවෙන ආකාරය
- කුටදන්ත සූත්‍රයට අනුව විවිධ වෘත්තීන්හි යෙදෙන්නන්ට අදාළ දේ සොයා බලා ලබාදීමට කටයුතු කිරීම.
- මීට අමතරව දසරාජ ධර්ම, පංචසීල ප්‍රතිපදාව, සතර සංග්‍රහ වස්තු, සප්ත අපරිහානීය ධර්ම, සතර අගති විරතිය යන කරුණු වල පවත්නා සර්වකාලීන වැදගත්කම ඉදිරිපත් කරමින් දේශපාලනික කටයුතු සඳහා ඒවා ඉවහල් කර ගැනීමෙන් ඇතිවන සුන්දර දේශපාලන පරිසරය ගැන විස්තර වී තිබිය යුතු ය.

(ii) ජීවන ගැටළු අවම කර ගැනීමෙහි ලා අල්පේච්ඡතාවෙහි ඇති කාලීන වටිනාකම ඇගයීමට ලක් කරන්න.

- ආශාවන් සීමා කරගෙන අල්ප වූ අවශ්‍යතාවන් ඇතිව කටයුතු කිරීම අල්පේච්චතාවයි. ලද පමණින් සතුටුවීම, පහසුවෙන් පෝෂණය කළ හැකි බව, කටයුතු බහුල නොවීම, සැහැල්ලු දිවිපෙවතක් ගත කිරීම ඉන්ද්‍රිය සංවරය යන මෙම ගුණාංග ද අල්පේච්ඡ සංකල්පය තුළ අන්තර්ගතව ඇත.
- අල්පේච්ඡතාවට ප්‍රතිවිරුද්ධ මනෝභාවය මහිච්ඡතාවයි. මහිච්ඡතාවය බොහෝ සමාජ ගැටලු වලට හේතු වේ.
- වර්තමාන සමාජයේ පුද්ගලයා එකිනෙකා අභිබවා යෑමට දරන උත්සාහයේ ප්‍රතිඵලයක් වශයෙන් සමාජයේ තරගකාරීත්වය හට ගෙන තිබේ.
- තෘෂ්ණාව මුල්කරගෙන නිරායාසයෙන් මිනිසා තරගකාරිත්වයට යොමු වේ. එයට අනුබල දෙන විවෘත ආර්ථික සමාජ රටාවක් අප ඉදිරියේ නිර්මාණය වී ඇත. එය තරගකාරිත්වයට මිනිසා පොළඹවයි.
- තෘෂ්ණාව මුල්කරගෙන ධනවත් වීමට දරණ උත්සහය සමාජ විරෝධී සූරාකෑමේ මානසිකත්වයට මිනිසා පොළඹවයි. මේ නිසා මිනිසුන් අතර ගැටුම් වර්ධනය වීමෙන් සාමය බිඳ වැටේ, මැනව සබඳතා බිඳ වැටේ. මිනිසා තුළ වෛරය හා අතෘප්තිය වර්ධනය වී මානසික ව්‍යාකූල තත්ත්වයක් ඇති කරයි. මෙම සියලු අහිතකර මනෝභාවයන්ට මූලික හේතුව පුද්ගලයා අල්පේච්ඡතාවෙන් ඈත් වීමයි.
- තෘෂ්ණාව නිසා මිනිසා ලෞකික වශයෙන් විවිධ දුෂ්කරතාවලට හා විපත්වලට භාජනය වන ආකාරය බුදුරජාණන් වහන්සේ විසින් මහා දුක්ඛක්ඛන්ධ සූත්‍රයෙන් පැහැදිලි කර ඇත.

5. (i) ධන පරිභෝජනය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් සමාජ සංවර්ධනයට හා සහජීවනයට ඉවහල් වන අයුරු පෙන්වා දෙන්න.

- බුදුසමයට අනුව ධනය ගොඩ ගසා ගත යුත්තක් නොව සංසරණය විය යුත්තකි.
- උපයන ධනයෙන් තමා පිනවීම, දෙමාපියන් පිනවීම, අඹුදරුවන් පෝෂණය කිරීම, හිතමිත්‍රාදීන් පිනවීම, දැසිදස් කම්කරුවන් පිනවීම, මහණ බමුණන් විෂයෙහි දක්ෂිණාවන් ලබා දීම. ප
- පත්තකම්ම සූත්‍රයේ පංචබලි සංකල්පය අනුව දැහැමිව උපයන ධනය කොටස් හතරකට බෙදා සමාජ යුතුකම් විෂයෙහි යෙදවිය යුතු බව.
- එකේන හෝගේ භුංජෙය්‍ය.... යනාදී ක්‍රමයට උපයන ධනය කොටස් හතරකට බෙදා ආයෝජනය පරිභෝජනය හා සංරක්ෂණය සඳහා නුවණින් යෙදවිය යුතු බව.
- සිගාලෝවාද සූත්‍රයේ දක්වෙන යුතුකම් ඉටු කිරීමට යෙදවීම
- සුරාව සූදුව කාමමිථ්‍යාචාරය වැනි සමාජයට හානි වන දුෂ්චරිත සඳහා උපයාගත් සම්පත් නො යෙදවීම.

(ii) හොඳ නරක විනිශ්චය අදාල බෞද්ධ නිර්නායකවල පවත්නා ප්‍රායෝගික වැදගත්කම පිරික්සන්න.

- ලෝභ, ද්වේෂ, මෝහ යන චේතනා මුල්කොට ගත් ක්‍රියා අකුසල ක්‍රියා වන බව • අලෝභ, අදෝෂ, අමෝහ, යන චේතනා මුල්කොට ගත් ක්‍රියා කුසලක්‍රියා වන බව • ධම්මපදය යමක වග්ගයේ 'මනෝ පුබ්බංගමා ධම්මා.......'' යන පළමු හා දෙවන ගාථාවලින් ක්‍රියා තීරණය කිරීමෙහි ලා චේතනාව සහ විපාකය පාදක කොට ගැනීමට උගන්වා ඇති බව • 'චේතනාහං භික්ඛවේ කම්මං වදාමි...' ආදී දේශනාවෙන් ද කර්ම විනිශ්චයෙහිලා චේතනාව ම පාදක කොට ගත හැකි අයුරු පැහැදිලි වන බව. • කාලාම සත්‍රයේදී ද චේතනාව හා විපාකය අනුව කුසල අකුසල කර්ම නිශ්චය කිරීමට මඟ පෙන්වා ඇති බව. • යම් ක්‍රියාවක් කොට පසුතැවිල්ලට පත් වෙමින් කඳුළු පිරි දෙනෙතින් විපාක විඳීමට සිදු වේ නම් එවැනි දෑ නරක ක්‍රියා බව • යම් ක්‍රියාවක් කොට පසුතැවීමට සිදු නොවේනම් සිනාමුසු මුහුණින් විපාක විඳීමට හැකි වේ නම් එවැනි දෑ හොඳ ක්‍රියා බව. • ඉධ තප්පති පෙච්ච තප්පති, ඉධ නන්දති පෙච්ච නන්දති ආදී ධම්ම පද දේශනාවල ද මෙලොව හා පරලොව වශයෙන් විපාක මුල් කොට පින් පව් තීරණය කිරීමට උගන්වා ඇති බව. • අම්බලට්ඨික

රාහුලෝවාද සූත්‍රයේදී ද තමාට හා අනුන්ට මෙන් ම දෙපක්ෂයට ම අයහපතක් වන ක්‍රියා නරක ක්‍රියා ලෙසත්, යහපතක් වන ක්‍රියා හොඳ ක්‍රියා ලෙසත් පෙන්වා දී ඇති බව. • තමා පිළිබඳව ද ලෝකයා පිළිබඳව ද ධර්මය පිළිබඳව ද අධිපති කොට සිතා හොඳ නරක නිශ්චය කළ හැකි බව • කැඩපතකින් තමා ම තම සිරුර නිරීක්ෂණය කරන්නා සේ තම කායික, වාචසික හා මානසික ක්‍රියා ප්‍රත්‍යවේක්ෂා කළ යුතු බව • අත්තානං උපමංකත්වා ආදී වශයෙන් දැක්වෙන අන්තුපනායික ධර්මය අනුව ද හොඳ නරක නිශ්චය කළ හැකි බව. • රාග, ද්වේශ, මෝහ සහගත ක්‍රියා නොකළ යුතු අසාධු පාප ක්‍රියා ලෙස දක්වන කාලාම සූත්‍රය තමා විසින් ම ස්වාධීන ව සිතා බලා තීරණය කළ යුතු යයි දක්වන බව.

6. (i) සෞන්දර්ය රසාස්වාදය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් පුද්ගල ජීවිතයේ ගුනාත්මක සංවර්ධනය සඳහා ඉවහල් කරගත හැකි ආකාරය විමර්ශනය කරන්න.

- මිනිසාට සුවදායක වූත් ප්‍රීති ජනක වූත් ජීවිතයක් ගත කිරීමට බුදු සමය නිරතුරුව අනුබල දෙයි. එබැවින් ප්‍රබුද්ධ රුචිකත්වයක් ඇති පුද්ගලයෙකු බිහිවීමට බුදු සමයෙන් බාධාවක් නැත.
- නතේ කාමායානි චිත්‍රානි ලෝකේ යන බුදු වදනට අනුව ලොව විචිත්‍ර දේ කාමයෝ නො වන බවත්, පුද්ගලයකු තුල පවතින රාග සංකල්ප කාමය වන බවත් නුවණැත්තන් කාමයෙන් තොරව සෞන්දර්ය ආශ්වාදනය කරන බවත් මෙකී ආකල්පයෙන් වීතරාගී රහත් උතුමන් උපාදානයෙන් තොරව සුන්දරත්වය අත්විඳින බව විස්තර විය යුතු ය.

- මලක සුන්දරත්වය දකින ප්‍රබුද්ධයා එහි වර්ණය ද සුගන්ධය ද විඳගනී. ඒ භාවමය දියුණුව තුලිනි. එසේම හෙතෙම මල මැලවෙන වැනසෙන ධර්මයක් බව ද දනී. ඒ යතාවබෝධයෙනි.

(ii) වර්තමානයේ පැනනැගී ඇති පරිසර ගැටළු අවම කර ගැනීමට ඇතැම් බෞද්ධ ඉගැන්වීම් උපකාරී වන අයුරු සාකච්ඡා කරන්න.

- බුදුරදුන් ශ්‍රේෂ්ඨතම පරිසර හිතකාමී අයෙකු බව පිළිබිඹු වන අවස්ථා මුළු බුද්ධ චරිතය පුරාම දක්නට ලැබෙන බව
- පරිසර සංරක්ෂණයට අදාළ බොහෝ ඉගැන්වීම් කර ඇති අතර ඒවා වත්මන් සමාජයේ ගැටළු අවම කර ගැනීමට හේතුවන බව
- වනරෝපා සූත්‍රය තුළින් පරිසර හිතකාමී ක්‍රියාකාරකම් නිතර පින් වැඩෙන කටයුතු ලෙස දන්වා තිබීම.
- ජලයට මළ මුත්‍රා හෙළීම, කෙළ ගැසීම, තිල්තණ මත කැළි කසල මළ මුත්‍ර හෙළීම නො කළ යුතු බව හා වස් විසීම පරිසර සංරක්ෂණය අපේක්ෂාවෙන් කළ ක්‍රියාකාරකමක් බව.
- වර්තමානයේ කැලෑ එළිකිරීම, ජලය දූෂණය කිරීම, අපද්‍රව්‍ය නිසි කළමණාකරණයකින් තොරව සිදු කිරීම, න්‍යෂ්ටික අත්හදා බැලීම්, යුධමය ක්‍රියාකාරකම් නිසා විශාල වශයෙන් පරිසදරයට හානි සිදුවන බව විස්තර කිරීම අවශ්‍යය.

7. (i) ''අරපිරිමැස්ම'' සම්පත් කළමණාකරණයේදී නූතන කළමණාකරුවන්ගේ ද විශේෂ අවධානයට යොමු වන බැවින් එයට අදාළ බෞද්ධ ඉගැන්වීම් ගෙන හැර දක්වන්න.

- අංගුත්තර නිකායේ කුල සූත්‍රය තුළින් සම්පත් අරපිරිමැස්මට අදාල කාරණා හතරක් ඉදිරිපත් කර ඇති බව.
  1. නැති වූ යමක් වේ නම් නැවත ඉපයීම
  2. දිරාගිය යමක් වේ නම් පිලිසකර කිරීම.
  3. සීමාවන් දැන සම්පත් පරිභෝජනය කිරීම
  4. සිල්වත් ස්ත්‍රියක් පුරුෂයෙක් නිවසක ආධිපත්‍ය ඉසිලීම.
- ආනන්ද හිමියන්ට ලැබුණු වස්ත්‍ර 500 පරිහරණය කිරීම හා සිදු වීම.
- ජීවක වෛද්‍යතුමන් ප්‍රතිකාර කිරීමට සිටු නිවසකට ගිය අවස්ථාවක සිටු දියණිය බිම වැටුණ තෙල් බින්දුව පවා ආරක්ෂා කිරීමට යොමු වීම හා සම්බන්ධ කතා පුවත යනාදී බෞද්ධ ඉගැන්වීම් වර්තමාන කළමණාකරුවන්ට ද අතිශය වැදගත් වන බව අවධාරණය විය යුතු ය.

(ii) සාදාචාරාත්මක සංවර්ධනය උදෙසා නීතිගරුකත්වයේ ඇති වැදගත්කම බෞද්ධ ඉගැන්වීම් ඇසුරෙන් පහදන්න.

- බෞද්ධ භික්ෂූන් වහන්සේලා උදෙසා බුදුරදුන් පනවා ඇති විනය නීති සදාචාරාත්මක සංවර්ධනය සඳහා හේතුවන අයුරු විස්තර කර ඇති බව.
- රටක, සමාජයක, පැවැත්මට ව්‍යවස්ථාගත ව නීතියට එකඟ වියයුතු බව.
- සප්ත අපරිහානීය ධර්මවල දක්වෙන නො පැනවූ නීති නො පැනවීමත් පැනවූ නීති කඩ නො කර ආරක්ෂා කිරීමටත් යන ධර්මය තුලින් නීතිගරුකත්වයේ ඇති අගය තහවුරු කර ඇති බව විස්තර විය යුතු ය.

8. (i) පුද්ගලයාගේ මෙලොව අභිවෘද්ධිය උදාකරලීමට අනණ සූත්‍රයේ දක්වෙන චතුර්විධ සුඛයෙහි කාලීන වැදගත්කම පෙන්වා දෙන්න.

- මිනිසා සුඛකාමී සත්ත්වයකු ලෙස බුදුසමය පිළිගන්නා නමුදු කාමසුඛල්ලිකානු යෝගය බැහැර කරන බව.
- සසර දුක් සහිත යැයි බුදුසමය අවධාරණය කරන නමුදු එහි සැපයක් නැතැයි ඉන් අදහස් නො වන බව සහ සාදාචාරාත්මක සීමාවන් තුළ ගිහි බෞද්ධයා ලෞකික වූ පස්කම් සුව විඳීම බෞද්ධ ඉගැන්වීම්වලට විරුද්ධ නොවන බව.
- අත්ථි, භෝග, අනණ, අනවජ්ජ යන සුඛයන් ගිහි සැපය සම්බන්ධයෙන් වැදගත් වන අතර ගෘහස්ථ ජීවිතයට අදාළ ව එම සැප බුදු සමයෙහි අගය කොට ඇති බව.

(ii) වෙහෙස වී වැඩ කිරීම මෙන් ම විවේක ගැනීම ද මිනිසුන්ට අවශ්‍ය බව ධර්මානුකූලව පෙන්වා දෙන්න.

- දිළිඳුකම කාමභෝගී ගිහියාට දුකක් ලෙස බුදුසමය උගන්වන බව
- ධන සම්පත් නො මැති වීම සමාජ ව්‍යසනයන්ට හේතු වන බව
- ආර්ථික සමෘද්ධිය ඇති කර ගැනීම ගෘහස්ථ ජීවිතයේ සාර්ථකත්වයට අත්‍යවශ්‍ය සාධකයක් ලෙස බුදුසමය අවධාරණය කරන බව
- ධාර්මික ව ධනය ඉපැයිය යුතු යැයි බුදුසමය උගන්වා ඇති බැවින් ඒ සඳහා උට්ඨාන වීර්යෙන් දහඩිය මහන්සියෙන් වෙහෙස වී වැඩ කළ යුතු බවට උපදෙස් බුදු දහමින් ලබා දී ඇති බව විස්තර විය යුතු ය.
- සිගාලෝවාද සූත්‍රයේ දී ස්වාමියාගේ යුතුකම් ලැයිස්තුවට ඇතුළත් සුදුසු කල්හි වැඩ කටයුතුවලින් නිදහස් කිරීම හා කලින් කලට නිවාඩු ලබාදීම යන කරුණු තුළින් විවේක ගැනීමේ වැදගත්කම අවධාරණය විය යුතු ය.



LOL.lk
Learn Ordinary Level
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර
G.C.E. O/L
විද්‍යාව
A9+
GUIDE
PAST PAPERS
ඉංග්‍රීසි භාෂාව
ENGLISH LANGUAGE
සිංහල
G.C.E. O/L SINHALA
General English
• Past Papers • Model Papers • Resource Books
for G.C.E O/L and A/L Exams
සමනල දැනුම
විභාග ඉලක්ක ජයගන්න
Knowledge Bank
Master Guide
WWW.LOL.LK
CASH ON
DELIVERY
HOME
DELIVERY
Whatsapp contact
+94 71 777 4440
Website
www.lol.lk
Order via WhatsApp
071 777 4440